අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2025 (2026)**
**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை- 2025 (2026)**
General Certificate of Education (Ord. Level) Examination - 2025 (2026)

# පුරවැසි අධ්‍යාපනය

## Civic Education - குடியியற் கல்வி

අනුහුරු ප්‍රශ්න පත්‍රය (සිංහල මාධ්‍යය)
**பயிற்சி வினாத்தாள்**
**Practice Paper**




**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
**Ministry of Education, Higher Education and Vocational Education**
**National Languages and Humanities Branch**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

| 62 | S | I |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය (අනුහුරු ප්‍රශ්න පත්‍රය ) - 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை (பயிற்சி வினாத்தாள்) – 2025 (2026)
General certificate of Education (ord. Level) Examination (Practice Paper) - 2025 (2026)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්, යොදාගන්න.

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ශ්‍රී ලංකාවේ වැඩිම ලියාපදිංචි ඡන්ද දායක සංඛ්‍යාවක් සිටින මැතිවරණ දිස්ත්‍රික්කය වන්නේ,
   (1) කොළඹ ය. (2) කුරුණෑගල ය. (3) ගම්පහ ය. (4) මහනුවර ය.

2. නිෂ්පාදනය සඳහා මිනිසා විසින් යොදවනු ලබන මෙවලම් සහ උපකරණවලට කරනු ලබන ගෙවීම් වන්නේ,
   (1) පොළිය (2) කුලිය (3) ලාභය (4) වැටුප

3. පළාත් පාලන ක්‍රියාවලිය වෙනුවෙන් ගම් කාර්ය සභා බලතල පුළුල් කිරීමට විධායක කාරක සභා ක්‍රමයක් ඇති කළ ආණ්ඩුක්‍රමය වන්නේ,
   (1) සෝල්බරි (2) ඩොනමෝර් (3) කෲව් මැකලම් (4) මැනිං

4. වෘත්තීය ක්ෂේත්‍රය තුළ සේව්‍ය - සේවක දෙපාර්ශ්වය අතර ගැටුම්කාරී තත්ත්වයක් ඇති වූ විට එය විසඳන ක්‍රමය වන්නේ,
   (1) සාකච්ඡා කිරීම (2) මැදිහත්කරණය (3) සමථකරණය (4) සහමන්ත්‍රණය

5. සාර්ව ගැටුම්කාරී තත්ත්වයකට නිදසුනක් වන්නේ,
   (1) පුද්ගලයා තුළ ඇතිවන ගැටුම් ය. (2) අසල්වැසියන් අතර ඇතිවන ගැටුම් ය.
   (3) පවුල් තුළ ඇතිවන ගැටුම් ය. (4) ජන වර්ග අතර ගැටුම් ය.

6. පරිසරයෙන් ලැබෙන ආර්ථික උපකාරක සේවාවක් වන්නේ,
   (1) ඛණිජ සම්පත් (2) හිරු එළිය (3) වාතය (4) ජලය

7. මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කරගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම හඳුන්වන්නේ,
   (1) යුතුකම් (2) සමානාත්මතාවය (3) අයිතිවාසිකම් (4) නිදහස



[දෙවැනි පිටුව බලන්න.

8. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක සම්මතවන ප්‍රඥප්ති සඳහා අනුමැතිය ලබා දෙන්නේ,

(1) ජනාධිපතිවරයා ය. (2) කථානායකවරයා ය.
(3) ආණ්ඩුකාරවරයා ය. (4) මහ ඇමතිවරයා ය.

9. රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම අරමුණු කරගත් උත්තරීතර නීතිය හඳුන්වන්නේ,

(1) මානව හිමිකම් නීතිය යනුවෙනි. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යනුවෙනි.
(3) අපරාධ නීතිය යනුවෙනි. (4) සිවිල් නීතිය යනුවෙනි.

10. " කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත්, එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය." යන ප්‍රකාශය කරනු ලැබුවේ,

(1) මහාචාර්ය ගානර් ය. (2) ඒබ්‍රහම් ලින්කන් ය.
(3) හැරල්ඩ් ලැස්කි ය. (4) ජී.ඩී.එච්. කෝල් ය.

11. රටක සංවර්ධනය මනින මිනුම් අතර මානව සංවර්ධන දර්ශකය (HDI) යටතේ මනිනු ලබන සංරචකයක් වන්නේ,

(1) සාක්ෂරතාවය යි. (2) ක්‍රය ශක්තිය යි.
(3) ළදරු මරණ අනුපාතය යි. (4) දුරකථන ඝනත්වය යි.

12. මෙරට පහළ අධිකරණ කටයුතු ස්වාධීනව පවත්වාගෙන යාමට පිහිටුවා ඇති අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා වන්නේ,

(1) අධිකරණ ඇමති ය. (2) නීතිපති ය.
(3) අගවිනිසුරු ය. (4) දිසාවිනිසුරු ය.

13. ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ,

(1) ධනවාදී අර්ථ ක්‍රමයයි . (2) සමාජවාදී අර්ථ ක්‍රමයයි.
(3) මිශ්‍ර අර්ථ ක්‍රමයයි. (4) වෙළෙඳපොළ අර්ථ ක්‍රමයයි.

14. මත්ද්‍රව්‍ය සම්බන්ධ සිදුවීම් රහසිගතව දැනුම්දීමට ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී හඳුන්වා දී ඇති ක්ෂණික දුරකථන අංකය (Hotline) වන්නේ,

(1) 1818 (2) 1819 (3) 1987 (4) 1997

15. නේටෝ (NATO) සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම මුල්කර ගනිමින් යුධ ගැටුමකට මැදි වූ රටවල් දෙක වන්නේ,

(1) ඊශ්‍රායලය - පලස්තීන (2) ඉරානය - ඊශ්‍රායලය
(3) රුසියාව - යුක්‍රේනය (4) ඉන්දියාව - පාකිස්තානය

16. යුරෝපයේ පැවති වැඩවසම් පාලන ක්‍රමයට එරෙහිව බ්‍රිතාන්‍යය කේන්ද්‍ර කරගෙන ජනතා නියෝජිතයන්ගේ බලය ඉස්මතු වූයේ කුමන විප්ලවය මගින්ද?

(1) 1688 ඉංග්‍රීසි විප්ලවය (2) 1776 ඇමරිකන් විප්ලවය
(3) 1789 ප්‍රංශ විප්ලවය (4) 1917 රුසියන් විප්ලවය

17. ආර්ථික අරමුණු මුල් කරගෙන ලෝකයේ බිහි වූ පළමු ආර්ථික කලාපීය සංවිධානය කුමක්ද?

(1) ගැට් සංවිධානය (2) ආසියාන් සංවිධානය
(3) උන්ක්ටාඩ් සංවිධානය (4) යුරෝපා සංවිධානය

18. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ සංක්‍රමණික සාධකයක් වන්නේ,

(1) සේන ගුත්තික පැමිණීම (2) පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
(3) පණ්ඩු පාරින්දගේ පැමිණීම (4) කාලිංග මාඝ ඇතුළු පිරිස පැමිණීම



[තුන්වෙනි පිටුව බලන්න.

19. පාරිසරික ගැටලු ඇතිවීම සඳහා මුල්වන ප්‍රධානතම හේතුව වන්නේ,
(1) කාලගුණ රටාවේ වෙනස්කම් ය. (2) ඕසෝන් ස්ථරය විනාශවීම ය.
(3) ව්‍යසන සහ වසංගත ය. (4) සම්පත් අධි පරිභෝජනය ය.

20. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය සතු කාර්යයක් වන්නේ,
(1) නීති විවරණය කිරීම ය. (2) පනත් කෙටුම්පත් විවරණය ය.
(3) අයවැය පාලනය කිරීම ය. (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම ය.

21. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති මහජන සෞඛ්‍යය සේවාවට අයත් කාර්යයක් වන්නේ,
(1) පොදු නාන ස්ථාන පවත්වාගෙන යාම ය. (2) මහජන වෙළෙඳපොළ පවත්වා ගැනීම ය.
(3) පොදු කාණු ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම ය. (4) ජල මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම ය.

22. පාරිභෝගික, අන්තර් හා ප්‍රාග්ධන භාණ්ඩ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) පොහොර, යන්ත්‍ර සූත්‍ර, ඖෂධ (2) ඖෂධ, දැව, යන්ත්‍ර සූත්‍ර
(3) යන්ත්‍ර සූත්‍ර, ඖෂධ, දැව (4) ඇඳුම්, ඖෂධ, යන්ත්‍ර සූත්‍ර

23. අන්තර්ජාතික ගැටුමකට හේතුවිය හැකි ඕනෑම ආරවුලක් පිළිබඳව පරීක්ෂා කිරීමේ බලතල හා කාර්යය හිමිවන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ,
(1) මහා මණ්ඩලයට ය. (2) භාරකාර මණ්ඩලයට ය.
(3) ලේකම් කාර්යාලයට ය. (4) ආරක්ෂක මණ්ඩලයට ය.

24. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට සිදුකරන සෘණාත්මක බලපෑමක් වන්නේ,
(1) අපනයන විවිධාංගීකරණය යි. (2) බුද්ධි ගලනය වේගවත් කිරීම යි.
(3) ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් කිරීම යි. (4) දේශීය නිෂ්පාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීම යි.

25. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති පළාත් පාලන ආයතන අතර, මහනගර සභා පිහිටුවා ඇති පනත වන්නේ,
(1) 1939 අංක 61 දරන පනත ය. (2) 1987 අංක 15 දරන පනත ය.
(3) 1987 අංක 42 දරන පනත ය. (4) 1947 අංක 16 දරන පනත ය.

26. විශ්වීය සංකල්පයක් වන මානව අයිතිවාසිකම් පුද්ගලයාට ලබා දීම තුළින් ආරක්ෂාවන මූලධර්ම නම්,
(1) පැවැත්ම හා ගරුත්වය යි. (2) සාධාරණත්වය හා සමානත්වය යි.
(3) සමානත්වය හා පැවැත්ම යි. (4) සාධාරණත්වය හා ගරුත්වය යි.

27. සමාජයේ පොදුවේ පිළිගනු ලබන සද්-චාරිත්‍ර ධර්මයක් වන්නේ,
(1) පොදු දේපළ ආරක්ෂා කිරීම ය. (2) ත්‍රස්තවාදය පිටුදැකීමට ක්‍රියා කිරීම ය.
(3) පරිසරය ආරක්ෂා කිරීම ය. (4) මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිතයෙන් වැළකී සිටීම ය.

28. සමාජ සංවර්ධනයට සහ යහපාලනයට සහාය දීම සඳහා පුරවැසියා විසින් ප්‍රගුණ කළ යුතු කාර්යයක් වන්නේ,
(1) ප්‍රාදේශීය ආරක්ෂාව තහවුරු කිරීම ය. (2) නායකයින්ට ආරක්ෂාව සැපයීම ය.
(3) සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම ය. (4) ගැටුම් ඇතිකර ගැනීමෙන් වැළකීම ය.

29. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණයක් වන්නේ,
(1) එක් ආගමක් අදහන ජන කණ්ඩායමක් පැවතීමයි.
(2) නිශ්චිත දේශ සීමාවකට සීමා වී පැවතීමයි.
(3) එක් ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයක් පැවතීමයි.
(4) ගෝලීයකරණය නිසා සංස්කෘතිය පටු ක්ෂේත්‍රයක විහිදී පැවතීමයි.


[හතරවැනි පිටුව බලන්න.

30. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති දිසා අධිකරණයක් මගින් විසඳන නඩු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දික්කසාද නඩු, බෙදුම් නඩු, ස්ත්‍රී දූෂණ නඩු
(2) තෙස්තමේන්තු නඩු, විවාහ ශූන්‍ය කිරීමේ නඩු, ගෙවල් කුලී නඩු
(3) තෙස්තමේන්තු නඩු, මිනී මැරුම් නඩු, ස්ත්‍රී දූෂණ නඩු
(4) දික්කසාද නඩු, ස්ත්‍රී දූෂණ නඩු, ගෙවල් කුලී නඩු

31. විවිධ ජන වර්ග හා ආගම් අදහන පිරිසක් සිටින සමාජයක එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,
(1) එක් ආගමකට පමණක් ගරු කිරීමට පුරුදු වීමයි.
(2) අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වීමයි.
(3) අන්‍ය ආගම්වලට නිගරුවන ආකාරයට හැසිරීමට පුරුදු වීමයි.
(4) එක් සංස්කෘතියක් පමණක් ප්‍රවර්ධනය කිරීමයි.

32. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් වන්නේ,
(1) විධායකය, ව්‍යවස්ථාදායකයට සෘජුව වගකීමට බැඳී නැත.
(2) විධායක බලය ජනාධිපතිවරයා විසින් හසුරුවනු ලැබේ.
(3) ආණ්ඩුවේ නායකත්වය ජනාධිපති විසින් දරනු ලබයි.
(4) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වේ.

33. ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් වන්නේ,
(1) ප්‍රාදේශීය ඒකක ඕනෑම අවස්ථාවක අහෝසි කළ හැකි වීම ය.
(2) රාජ්‍යයේ ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වෙත බෙදී පැවතීම ය.
(3) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය මණ්ඩල දෙකකින් සමන්විත වීම ය.
(4) භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවලට වඩාත් යෝග්‍ය වීම ය.

34. රටක නීති පැනවීමේ ප්‍රධාන පරමාර්ථයක් ලෙස සැලකෙන්නේ ජනතාවගේ,
(1) ජීවිත, රැකියා, පවුල ආරක්ෂා කිරීමයි.
(2) දේපළ, රැකියා, අයිතීන් ආරක්ෂා කිරීමයි.
(3) ජීවිත, දේපළ, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.
(4) ජීවිත, දේපළ, රැකියා ආරක්ෂා කිරීමයි.

35. තිරසර සංවර්ධන සංකල්පය තුළ දී මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමේදී අවධානය යොමු කළ යුත්තේ,
(1) සම්පත් අනාගත පරම්පරාව වෙනුවෙන් සුරක්ෂිත කිරීම කෙරෙහි ය.
(2) ආර්ථික අවශ්‍යතා පමණක් සපුරා ගැනීම කෙරෙහි ය.
(3) ලාභ අපේක්ෂාවෙන් කරනු ලබන නිෂ්පාදන කෙරෙහි ය.
(4) සම්පත්වල ඵලදායීතාවය වැඩිකර ගැනීම කෙරෙහි ය.

36. රටක ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස ඉතා හොඳින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වාතාවරණය ගොඩනැගෙන්නේ,
(1) අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඇගයීමෙනි.
(2) නියෝජිතයින් මහජනතාවගේ කැමැත්ත මත තේරීමෙනි.
(3) රටක බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වීමෙනි.
(4) බහුතර කැමැත්ත මත නීති සම්පාදනය කිරීමෙනි.

37. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අයිතිවාසිකම් ලබාදීමේ අරමුණ වන්නේ,
(1) පුද්ගලයාට තම නිදහස ඇතිකර ගැනීමට ඉඩදීම ය.
(2) සමාජය තුළ සමානාත්මතාවය ක්‍රියාත්මක කිරීම ය.
(3) පුද්ගල සංවර්ධනය තුළින් සමාජයේම අභිවෘද්ධිය ඇති කිරීම ය.
(4) දේශපාලන, ආර්ථික, සමාජයීය අවශ්‍යතා ඉටුකර ගැනීම ය.

38. පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ ආයතනය කුමක්ද?

- 1996 අංක 21 දරන පනත මගින් පිහිටුවා ඇත.
- ජනාධිපති විසින් පත්කරන 20 දෙනෙකුගෙන් සමන්විත ය.
- ජනතාවට සෘජුව පැමිණිලි කළ හැකිය.

(1) මානව හිමිකම් කොමිසම (2) අධිකරණ සේවා කොමිසම
(3) පොලිස් සේවා කොමිසම (4) විගණන සේවා කොමිසම

39. පහත සඳහන් "අ" තීරුවෙන් ලෝකයේ සංවිධාන හා "ආ" තීරුවෙන් එම සංවිධානවල ප්‍රධාන මූලස්ථානය පිහිටි රට හා නගරය දැක්වේ. ඒ අනුව "අ" තීරුව හා "ආ" තීරුව සමඟ ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| "අ" | "ආ" |
|---|---|
| 1. බිම්ස්ටෙක් (BIMSTEC) | A - ඉන්දුනීසියාවේ ජකර්තා |
| 2. ආසියාන් (ASEAN) | B - ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් |
| 3. සාර්ක් (SAARC) | C - බංග්ලාදේශයේ ඩකා |
| 4. එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) | D - නේපාලයේ කත්මණ්ඩු |

(1) BDAC (2) CADB (3) CDBA (4) DACB

40. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - මිනිසා ඇතුළු සියලුම සත්ත්වයින් ද, ශාක හා ක්ෂුද්‍ර ජීවීන් ද, ජෛව පරිසරයට අයත් වේ.

B - පෘථිවියෙහි අන්තර්ගත ජීවී අජීවී සමස්තය ස්වාභාවික පරිසරයට අයත් වේ.

එම ප්‍රකාශ අතුරින්,

(1) A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි.
(2) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
(3) A හා B යන ප්‍රකාශ දෙකම සත්‍ය වේ.
(4) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.

**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

| 62 | S | II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය- 2025 (2026)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

පුරවැසි අධ්‍යාපනය II

- ❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1.

I. වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ **දෙකක්** නම් කරන්න.
II. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන **දෙකක්** නම් කරන්න.
III. ඕනෑම අර්ථ ක්‍රමයක මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** සඳහන් කරන්න.
IV. අන්තර්ජාතික නීතිය ඇසුරින් පැන නැගුණු නීති ශාඛා **දෙකක්** ලියන්න.
V. රටක ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට පුරවැසියාගෙන් ඉටුවිය යුතු වගකීම් **දෙකක්** සඳහන් කරන්න.
VI. සමාජය තුළ විවිධ පීඩාවන්ට පහසුවෙන් ගොදුරුවීමට ඉඩ ඇති පුද්ගල කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.
VII. ස්වාභාවික වූ පෘථිවි පරිසරය විනාශ කිරීමට බලපාන **ද්විත්ව** ක්‍රියා මොනවාද?
VIII. සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන දිළිඳුබවේ විෂම චක්‍රය තුළ දක්නට ලැබෙන අවස්ථා **දෙකක්** ලියන්න.
IX. රාජ්‍යයකට විදේශ ආධාර සපයන ආකාර **දෙකක්** ලියන්න.
X. ගැටුම් ඇතිවීමට බලපාන මූලයන් අතර දේශපාලන තත්ත්ව **දෙකක්** නම් කරන්න.

**(ලකුණු 02×10 = 20 යි)**

2. ජනතා අදහස් නියෝජනය වන, ජනතා සහභාගිත්වය සිදුවන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය නූතන රාජ්‍යයන්හි වැදගත්ම පාලන ආකෘතිය බවට පත්ව ඇත.

I. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතා නියෝජිතයන් තෝරා ගැනීම සඳහා යොදා ගන්නා නියෝජන ක්‍රම **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**
II. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ **තුනක්** නම් කරන්න. **(ලකුණු 03 යි)**
III. (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**
(b) "සමාජයක පවතින අති මූලික දේශපාලන සංවිධානය රාජ්‍යයයි." රාජ්‍ය මගින් ජනතාව වෙත ඉටුකළ යුතු කාර්යයන් **දෙකක්** දක්වා ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

3. විවිධ සංස්කෘතීන් සහිත පුද්ගලයන් එක්සත්ව ජීවත්වීම ශක්තිමත් දේශයක් ගොඩනැගීම කෙරෙහි බලපාන හේතුවක් වේ.

I. ශ්‍රී ලංකාවේ ජනතාව අදහන ආගම් **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**

II. බහු සංස්කෘතික සමාජයක යහපාලනය පවත්වාගෙන යාමට පාලකයින් සතු වගකීම් **තුනක්** නම් කරන්න. **(ලකුණු 03 යි)**

III. (a) බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම බිඳවැටීමට බලපාන හේතු **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**

(b) ඉහත (a) හි සඳහන් කළ අහිතකර ප්‍රතිඵල අවම කර ගැනීමට පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

4. ලෝකයේ සංවර්ධන ක්‍රියාවලිය තුළ සාධනීය හා නිර්මාණාත්මක කාර්යභාරයක් ඉටු කරන බලවේගයක් ලෙස ගැටුම් හඳුනාගත හැකිය.

I. ගැටුමක් ඇතිවීම කෙරෙහි බලපාන අසාමාන්‍ය පුද්ගල චර්යා **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**

II. ගැටුම් විසඳීම සඳහා උපදේශනයෙන් සිදු කරන කාර්යයන් **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

III. (a) ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයකු සතුවිය යුතු ගුණාංග **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b) ගැටුමක් සාමකාමීව නිරාකරණය කිරීමෙන් රාජ්‍යයට ඇතිවන ප්‍රයෝජන **දෙකක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

5. නීතිය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා පුරවැසියා සාධාරණ හා අපක්ෂපාතී විනිශ්චයක් ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කර ගනී.

I. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන පොදු නීතියට අමතරව පවතින වෙනත් විශේෂ නීති වර්ග **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

**II.** නීතියේ ආධිපත්‍යය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

III. (a) රටක අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම නිසා ඇතිවිය හැකි වාසිදායක තත්ත්වයන් **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b) ඔබ නීතිගරුක පුරවැසියෙක් ලෙස ජීවත් වීමෙන් අත්වන ප්‍රයෝජන **දෙකක්** දක්වා ඉන් **එකක්** පැහැදිලි කරන්න. **(ලකුණු 03 යි)**

6. මිනිසා ඇතුළු සියලු සත්ත්වයින් ද ශාක ප්‍රජාව ද සජීවී, අජීවී සියල්ල හා ඒ අතර පවත්නා සම්බන්ධතා සියලු දෙනාගේ පැවැත්මට උපකාරී වේ.

**I.** වායු දූෂණය සිදුවන ස්වාභාවික ක්‍රම **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02 යි)**

II. සමාජ පරිසරයට සිදුවන හානි නිසා අත්වන අහිතකර ප්‍රතිඵල **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

**III.** (a) පරිසරය හා සම්බන්ධ පුරවැසි යුතුකම් **දෙකක්** ලියා දක්වන්න. **(ලකුණු 02 යි)**

(b) පරිසරය ආරක්ෂා කරගැනීමට පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා ඉන් **එකක්** විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

7. ලොව කිසිදු රටකට හුදකලා පැවැත්මක් නොමැති අතර අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට අන් ජාතීන්ගේ සහාය ලබා ගනියි.

I. ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ආකාර **දෙක** නම් කරන්න. **(ලකුණු 02 යි)**

**II.** ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමට බලපෑ හේතු **තුනක්** ලියන්න. **(ලකුණු 03 යි)**

III. (a) ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන යහපත් ප්‍රතිඵල **දෙකක්** ලියන්න. **(ලකුණු 02 යි)**

(b) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමෙන් අත්කරගෙන ඇති වාසි **දෙකක්** දක්වා ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 03 යි)**

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ 2025(2026)

# අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය (සිංහල මාධ්‍යය)
# Answer Sheet for the model paper
# மாதிரி வினாத்தாளுக்கான விடைத்தாள்

# පුරවැසි අධ්‍යාපනය

## CIVIC EDUCATION - குடியியற் கல்வி




## Answer Paper – I, II පිළිතුරු පත්‍රය – I, II (සිංහල මාධ්‍යය)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
National Languages and Humanities Branch

## පුරවැසි අධ්‍යාපනය I - පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 1 | 31. | 2 |
| 02. | 1 | 12. | 3 | 22. | 2 | 32. | 4 |
| 03. | 2 | 13. | 4 | 23. | 4 | 33. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 3 |
| 05. | 4 | 15. | 3 | 25. | 4 | 35. | 1 |
| 06. | 1 | 16. | 1 | 26. | 2 | 36. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 4 | 37. | 3 |
| 08. | 3 | 18. | 2 | 28. | 4 | 38. | 1 |
| 09. | 2 | 19. | 4 | 29. | 3 | 39. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 2 | 40. | 3 |

**(මුළු ලකුණු 1×40 = 40)**

## පුරවැසි අධ්‍යාපනය II - පිළිතුරු පත්‍රය

1.

I.

- ජනතා විමුක්ති පෙරමුණ
- එක්සත් ජාතික පක්ෂය
- සමගි ජන බලවේගය
- ඉලංගෛ තමිල් අරුසුකච්චි, ............ ආදී වශයෙන් **(මෙවැනි ඕනෑම පක්ෂ දෙකක්)**

II.

- පළාත් සභා
- පළාත් පාලන ආයතන
- දෙපාර්තමේන්තු
- සංස්ථා
- මණ්ඩල
- අධිකාරි **(මින් ඕනෑම කරුණු දෙකක්)**

III.

- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් උදෙසා නිෂ්පාදනය කරන්නේද? **(මින් ඕනෑම කරුණු දෙකක්)**

IV

- අන්තර්ජාතික මානව හිමිකම් නීතිය
- ආයෝජන නීතිය
- සාගර නීතිය
- පරිසර නීතිය **(මින් ඕනෑම කරුණු දෙකක්)**

v.

- ඵලදායී ජීවන වෘත්තියක නියැලීම
- අල්ලස, දූෂණය, නාස්තිය, වංචාව පිටු දැකීම
- නිදහස, සාධාරණත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- පොදු පහසුකම් අරපිරිමැස්මෙන් භාවිතය හා ඒවා ආරක්ෂා කිරීම
- ජාතික අභිමානය, ජාතික උරුම ආදිය රැක ගැනීමට සහ ආරක්ෂා කිරීමට දායක වීම

**(මින් ඕනෑම කරුණු දෙකක්)**

VI.

- කාන්තාවන්
- ළමයින්
- ආබාධිත ප්‍රජාව
- කම්කරුවන්
- ආදිවාසී ජනතාව **(මින් ඕනෑම කරුණු දෙකක්)**

VII

- ස්වාභාවික ක්‍රියාකාරකම්
- මිනිස් ක්‍රියාකාරකම්

VIII.

- අඩු ආදායම
- ඉහළ පරිභෝජන වියදම
- ඉතුරුම් අඩුවීම
- ප්‍රාග්ධන අඩුවීම
- නිෂ්පාදනය අඩුවීම **(මින් ඕනෑම කරුණු දෙකක්)**

IX.

- පරිත්‍යාග
- ණය
- භාණ්ඩ හා සේවා **(මින් ඕනෑම කරුණු දෙකක්)**

X.

- දේශසීමා
- බල ව්‍යාප්තිය

**(ලකුණු 2×10 = 20)**

2.

I.

- සරල බහුතර නියෝජන ක්‍රමය
- සමානුපාතික නියෝජන ක්‍රමය **(ලකුණු 02)**

II.

- නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්ද දායකත්වය ලබාදීම
- ඡන්ද අපේක්ෂකත්වය ලැබීමේ අයිතිය තහවුරු වී තිබීම
- නිදහසේ මැතිවරණ කටයුතුවලට සහභාගිවීමට ඇති අයිතිය තහවුරු වී තිබීම
- මැතිවරණ නීති රීතිවලට අනුකූල ව මැතිවරණ පැවැත්වීම

- සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම **(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- ආණ්ඩු පක්ෂය විසින් ඉටු කරනු ලබන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීම
- ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මක විවේචනය තුළින් ආණ්ඩුව සුමගට යොමු කිරීම
- ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්තිවලට හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වීම
- වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටු වීමට ක්‍රියා කිරීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- ආර්ථික හා දේශපාලන ස්ථාවරභාවය පවත්වා ගෙනයාම
- සමාජ සුබසාධක සේවා සැපයීම
- දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම
- පොදු සේවා පවත්වා ගෙනයාම
- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම
- යුධ කැරලි කෝලාහල වාර්ගික අර්බුද වැනි ගැටුම් විසඳීම
- මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

**(මින් ඕනෑම කාර්යයන් දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කර තිබිය යුතුයි. - ලකුණු 03)**

3.

I.

- බෞද්ධ
- හින්දු
- ඉස්ලාම්
- ක්‍රිස්තියානි / කතෝලික **(මින් ඕනෑම ආගම් දෙකක් සඳහා ලකුණු 02)**

II.

- ජනතා සුබසිද්ධිය උපරිම වන අයුරින් කටයුතු කිරීම
- පුරවැසි අයිතිවාසිකම් හා සමාජ සාධාරණත්වය සුරැකීම
- නීතිගරුක ව කටයුතු කිරීම
- විනිවිදභාවයෙන් කටයුතු කිරීම
- වංචා හා දූෂණයෙන් තොර ව වගවීමෙන් කටයුතු කිරීම **(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- එකිනෙකාට ගරු නොකිරීම
- එකිනෙකාගේ සංස්කෘතියන් ගැන අවබෝධයක් නොතිබීම.
- අන් ආගම්වලට අවමන් කිරීම
- සෑම විටම ගැටුම් ඇතිවන ලෙස කටයුතු කිරීම
- ආත්මාර්ථකාමීත්වය වෙනුවෙන් ක්‍රියා කිරීම
- එකමුතුකමින් ක්‍රියා නොකිරීම
- අන් ජන වර්ගවල භාෂාවන් ඉගෙනුමට යොමු නොවීම
- අන් මත නො ඉවසීම හා ඒවාට ගරු නොකිරීම
- සමානාත්මතාවයට ගරු නොකිරීම **(මින් ඕනෑම ආගම් දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- අන් සංස්කෘතීන්ට ගරු කිරීම
- අන්මත ඉවසීම හා ඒවාට ගරු කිරීම, ………. යනාදී වශයෙන්

**(සිසුවා විසින් පාසල් ශිෂ්‍යයෙකු ලෙස ගත හැකි ඕනෑම ක්‍රියාමාර්ගයක් දක්වා ඉන් එකක් විස්තර කර තිබේ නම් නියමිත ලකුණු ප්‍රදානය කරන්න) (ලකුණු 03)**

4.

I.

- අසහනය
- ආතතිය
- ක්ෂණික කෝපය
- නොරුස්නාකම
- ප්‍රචණ්ඩ වචන භාවිතය
- කලහකාරී හැසිරීම
- කායික පහරදීම **(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

II.

- විකල්ප විසඳුම් කරා පාර්ශ්වකරුවන් යොමු කිරීම
- ගැටුමින් ඇතිවන ප්‍රතිඵල හා පීඩාකාරී ස්වභාවයන් පිළිබඳ ව දෙපාර්ශ්වය ම දැනුවත් කිරීම
- ගැටුම් ලිහිල් කිරීම සඳහා පාර්ශ්වකරුවන් යොමු කරවීම **(ලකුණු 03)**

III. (a)

- ආත්මාවබෝධය
- කරුණාව හා මෛත්‍රිය
- ඉවසීම
- නිර්මාණාත්මක චින්තනය
- මුදිතාව
- සංවේදීබව
- ඵලදායි සන්නිවේදනය
- ඵලදායි තීරණ ගැනීම
- දරා ගැනීමේ ශක්තිය
- අවිහිංසක බව **(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02 )**

(b)

- ජීවිත හානි වැළකීම
- සම්පත්, දේපළ හානි වැළකීම
- මූලික හා මානව අයිතීන් ආරක්ෂා වීම
- මානසික ආතතිය අවම වීම
- පුද්ගල මානසිකත්වය ඉහළ යාම
- ආත්ම ගෞරවය සුරැකීම
- සාමය හා ආරක්ෂාව සුරක්ෂිත වීම
- දේශපාලන ස්ථාවරත්වය
- ආර්ථික ස්ථාවරත්වය
- ජාතික ඒකාබද්ධතාව ඇතිවීම
- රට සමෘද්ධිමත් වීම

**(මෙයින් කරුණු දෙකක් දක්වා ඉන් එකක් සිසුවා විසින් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය. - ලකුණු 03)**

5.

I.

- උඩරට නීතිය
- තේසවලාමේ නීතිය
- මුස්ලිම් නීතිය **(මින් ඕනෑම නීති දෙකක් සඳහා ලකුණු 02)**

II.

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳ ව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම
- නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් ලෙස නොසැලකීම
- සාධාරණ ව හා අප්‍රමාද ව යුක්තිය පසිඳලීම
- පුද්ගලයන්ගේ තරාතිරම රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක නොවීම
- නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොවීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

III. (a)

- පුද්ගලයන් තුළ අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසයක් ඇතිවීම
- නීතිය ඉදිරියට පැමිණීම
- රට තුළ සිදුවන අපරාධ හා දූෂණ මර්දනය කළ හැකිවීම
- රට තුළ නීතිය සමානාත්මතාවය හා සාධාරණත්වය ගොඩනැගීම
- යුක්තිය ඉටුකර ගැනීම සඳහා නියමිත ක්‍රමවේද භාවිතයට ගැනීම
- යුක්තිය ඉටුකර ගැනීම සඳහා විශාල කාලයක් ශ්‍රමයක් හා මුදලක් වැය නොවීම
- මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය වැඩිවීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)

- එකිනෙකා අතර සමගිය හා විශ්වාසය ගොඩනැගීම
- අන් ජාතීන්ට ගරු කරන පුද්ගලයන් බිහිවීම
- උසස් ජීවන මට්ටමක් ළඟා කරගත හැකිවීම
- අයිතිවාසිකම් ආරක්ෂා වීම
- රටක ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනැගීම
- ජීවත්වීමට සුදුසු සාමකාමී පරිසරයක් නිර්මාණය වීම, ..........
  **(යනාදී වශයෙන් නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත්වීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව සිසුවා අපේක්ෂා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.)** **(ලකුණු 03)**

6.

I.

- ලැව් ගිනි
- ගිනිකඳු පිපිරීම්
- දූවිලි කුණාටු **(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02 )**

II.

- සමාජ සබඳතා බිඳ වැටීම
- ආගමික හා වාර්ගික ගැටුම් ඇති වීම
- සමාජ අසාධාරණකම් සිදු වීම

- පවුල් සංස්ථා බිඳ වැටීම
- දෙමාපිය දූ දරු සබඳතා බිඳ වැටීම
- සමාජ දූරාචාර වැඩි වීම **(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03 )**

III. (a)

- පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය
- නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැළකීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය
- නිවස හා අවට පරිසරයේ රුක් රෝපණය දිරිමත් කිරීම
- පරිසරයේ පැවැත්ම හා වැදගත්කම වටහාගෙන කටයුතු කිරීම
- පරිසරය සුරැකීම පිළිබඳව අනෙකුත් පුද්ගලයින් දැනුම්වත් කිරීම
- පරිසර නීති රීතිවලට අනුකූල ව කටයුතු කිරීම
- පරිසරය සම්බන්ධ ව කටයුතු කරන ආයතනවලට පූර්ණ අනුග්‍රහය ලබාදීම
- සැම විට ම පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03)**

(b)

- නියමිත පරිදි කැලිකසල බැහැර කිරීම
- රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසරය ආරක්ෂා කර ගැනීම පිළිබඳව දැනුවත් කිරීම,…….. **(ආදී වශයෙන් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා සිසුන් යෝජනා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න)** **(ලකුණු 03)**

7.

I.

- රාජ්‍ය උපාය සම්බන්ධතා
- යුද උපාය සම්බන්ධතා **(ලකුණු 02)**

II.

- සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්
- අවශ්‍යතා සියල්ලම තම රට තුළ නිපදවාගත නොහැකි වීම
- අතිරික්ත නිෂ්පාදන අලෙවිකර ගැනීම
- ප්‍රවාහන හා සන්නිවේදනය දියුණුව
- දියුණු තාක්ෂණය ලබාගැනීමේ අවශ්‍යතාව
- හදිසි ආපදා හා වෙනත් විපත් අවස්ථාවලදී සහාය ලබා ගැනීම
- දේශපාලන ආර්ථික, සමාජයීය, සංස්කෘතික සබඳතා වැඩි දියුණු කර ගැනීම

**(මින් ඕනෑම කරුණු තුනක් සඳහා ලකුණු 03 )**

III. (a)

- ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වීම.
- නව රැකියා අවස්ථා උදා වීම
- හදිසි අවස්ථාවල දී අන්‍යොන්‍ය ආධාර උපකාර ලබාගත හැකිවීම
- නව තාක්ෂණික දැනුම හුවමාරු කර ගත හැකි වීම
- සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලැබීම

**(මින් ඕනෑම කරුණු දෙකක් සඳහා ලකුණු 02)**

(b)



- ණය සහ ආධාර ලබාගත හැකි වීම
- ජාත්‍යන්තර වෙළඳාම සමඟ සම්බන්ධ වීම
- ජාතික ආරක්ෂාව සහතික කරගත හැකිවීම
- විදේශ රටවල රැකියා අවස්ථා හිමිවීම
- සංචාරක කර්මාන්තය දියුණු කරගත හැකිවීම
- හදිසි අපදා තත්ත්වයන්වලදී සහාය ලබාගත හැකිවීම
- තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම හරහා අධ්‍යාපනය දියුණු කරගත හැකිවීම, .......... **(ආදී වශයෙන් සිසුන් යෝජනා කරන පිළිතුරු පිළිබඳ සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න)** **(ලකුණු 03)**